වයිරස ආසාදනය



# වෛරසයන් හා සම්බන්ධ පළු

## Viral Exanthems
## (Rashes Associated with Viruses)

### හැඳින්වීම

වයිරස ආසාදනයන් බිළිඳුන් සහ තරුණ ළමයින් අතර පොදුය. බොහෝ විට ඒවා සම මත සුලු පළු ඇති කරයි. පැතලි රතු තැන්, ඉස්මතුවී පෙනෙන කුඩා තඩිස්සියක්, විසප්පුවක්, weals (කෝටුවකින් තැලුවිට ඇතිවන ලකුණක් වැනි ) හෝ මේවා හා සම්බන්ධවී හමේ ඇතිවන ලකුණු.

විවිධ වයිරසයන් විවිධ පළු හා සමග සම්බන්ධයක් ඇතත් ඇතැම්විට විවිධ වයිරසයන් එකම පළුව ඇති කළ හැක. නියත වශයෙන්ම මොන වෛරසයක් කිනම් පළුවක් ඇති කරන්නේද යන්න නිතර නිතර කිය නොහැක. සමේ පළු හා සම්බන්ධ පිවිධ පොදු වයිරස පහතින් විග්‍රහ කර ඇත. මෙම තත්වයන් ආසාදනය (infectious) වන අතර සෘජුව ස්පර්ශවීම නිසා ඇතිවේ.

## Roseola Infantum

වයස අවුරුදු දෙකෙන් පහල ළමයින්ගේ උණ ඇති කරණ ඉතාමත්ම පොදු  වයිරස ආසාදනයකි. එය වයස මාස 6-9 දක්වා ඉතාමත්ම පොදුය. උෂ්ණත්ව සෙන්ටිගේඩ් 39-40 දක්වා ක්ෂණයකින් ඇතිවන උණ දින 3-5 දක්වා පවතී. නොරිස්සීමේ ගතියක් ඇතිවීම හැර දරුවා යහපත් තත්වයක පවතී. බෙල්ල ආශ්‍රිත ග්‍රන්ථි (gland) විශාල වන අතර ශරීර උෂ්ණත්වය පහල බැසීමත් සමගම බෙල්ලේ සහ ශරීරයේ ලා-රතු පාට ලප ඇතිවේ. එය, අත්, මුහුණ සහ කකුල් වලට පැතිරිය හැකි අතර දින 1-2 අතර මැකී යනු ඇත. කැසීම ඇති නොවන අතර ප්‍රථිකාර අවශ්‍ය නැත.

### අත පය සහ මුඛ රෝග

මෙම වයිරස ආසාදනය වඩාත් පොදු වශයෙන් ග්‍රීස්ම සහ ශරත් සෘතුවලදී බාල ළමයින්ට වැළඳෙනු දැකිය හැක. මෙය ගොවිපොළ වල සතුන්ට ඇති වන පාද සහ මුඛ රෝගය නොවේ. සාමාන්‍යයෙන් රෝග නිමිති මෘදු වන අතර ආරම්භයේදී ඇතිවන සුලු උණ ගතියක් දින හතක් පමණ කල් පවතී. මුඛයේ මතුවන කුඩා බිබිලි බොහෝවිට පුපුරා කුඩා වණ බවට පත්වේ. අණ්ඩාකාර කලු මුතු ඇට වැනි පටු රතු කෙළවර සහිත බිබිලි ඇඟිලි, පයේ ඇඟිලි සහ විලුඹ අවට පැති වල හට ගනී. කුඩා බිබිලි ගණන වෙනස්ව පවතින අතර දින 2-3 ක් අතර මැකී යති. කැසීමක් හෝ වේදනාවක් ඇති නොවේ. ප්‍රථිකාරයක් අවශ්‍ය නොවේ.

## Erythema Infectosum (Slapped Cheek/Fifth Disease)

මෙම වයිරස ආසාදනයේ සුලු පැතිරීම් වසන්ත කාලයේදී ඇතිවන අතර වයස අවුරුදු 2-10 ළමයින් අතර බහුලව හටගන්නා බවක් දැක්ක හැක. මෙම පළු කම්මුල් වල ගට ගනී. රතුවී උග්‍රවේ. (එබැවින් “slapped cheek disease” යන නමින් සඳුන්වනු ලැබේ. පැය 24 ඇතුලත එය වර්ධනය වන අතර උණ තිබේ නම් සාමාන්‍යයෙන් සුලු වශයෙන් පමණි. ඕබිලි රේන්දයක මෝස්තරය අනුව ශරීරය පුරා පැතිරිය හැක. සාමාන්‍යයෙන් එය දින 6-10 අතර මැකී යනු ඇත. ඊට පසු දරුවා උෂ්ණත්වයකට භාජනයවුව හොත් හෝ හිරු එළියට ලක්වුව හොත් අත්වල සහ කකුල්වල ඉදිරි සති කීපය තුල නැවත මතුවේ. ඕබිලි වලට ප්‍රථකාර අවශ්‍ය නැත.

## සරම්ප (Measles)

එන්නත් නිසා සරම්ප සුලබය. කෙසේ වෙතත් එය සමාජයෙන් සම්පූර්ණයෙන්ම ඉවත්වී නැත. මෙම වයිරසයේ මූලික රෝග ලක්‍ෂණ වශයෙන්  දින 3-5 දක්වා පවතින උණ, කැස්ස, රත් පැහැ නාස්පුඩු සහිත හෙම්බිරිස්සාව, ඇස් රිදීම ආදීය වේ. ශක්තිය හීන, නුරුස්සන ගති ඇති සාමන්‍යයෙන් අසනීප ගතියන් දරුවා පෙන්නුම් කරයි.

දෙවන දිනයේදී කම්මුල් ඇතුලත රතු වළල්ලක් ඇතුලත සුදට හුරු නිල් ළකුණු හට ගනී. හතරවන දිනයේදී නලළේ සහ කන පිටුපස රතු පළුවක් හටගෙන පැය 24 ඇතුලත මුහුණ ඇතුලු ශරීරයේ වෙනත් කොටස් වලට විහිදී යති. සතියකට පමණ පසු මෙම පළුව සම මත දුඹුරු පාට කැලැල්ලක් තබා මැකී යනු ඇත. පොත්ත ගැලවිය හැක. බොහෝ අවස්ථාවලදී  වැඩි දුශ්කරතාවයක් නොමැතිව ආසාදනය සම්පූර්ණයෙන්ම තැන්පත් වනු ලැබේ.

බිබිලි වලට නියමිත ප්‍රථිකාරයක් නොමැත. නමුත් දරුවාව ඇඳ මත විවේකිව ගත කිරීමට සැළැස්වීම, හැකි තරම් බීමට වතුර දීම,  සහ දීප්තිමත් එලිය වැටීම වැළැක්වීමට වග බලා ගත යුතුවේ. කුඩා දරුවන්ට දෙන පැරසිටමෝල් Paracetamol උණ මර්ධණය කර ගැනීම සඳහා දිය යුතුවේ.

## වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ළමා සෞඛ්‍ය හෙදිය
ඔබේ ඖෂධ වේදියා
ඔබේ පවුලේ දොස්තර මයා/මිය

චර්ම රෝග විශේෂයෙක් (A dermatologist)

© 2002, Department of Dermatology, St. Vincent’s Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia.